
# මගේ සිත් රූ



එන්.චනුති ඉමායා

# මගේ සිත් රූ


## එන්.චනුති ඉමායා

**කතෘ**


## කතෘගේ වෙනත් කෘති

**"මගේ පුංචි සුරංගනාවි"**

**2023**


**මහ/මහාමායා බාලිකා විද්‍යාලය**

**3 ශ්‍රේණිය A**



**2025.02.08**

**ISBN - 978 - 624 - 208 - 264 - 6**

# පිදුම

මගේ පංතිභාර

කුසලා ගුරුතුමියට

සමන්මලි ගුරුතුමියට

මගේ ආදරණීය

අම්මාට අප්පච්චීට

නංගිට අත්තම්මාට අත්තාට

සහ

පුංචි සිත්තරුවන්ට

මෙම පොත

ආදරයෙන්

පුදමි......

# පෙර වදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලාතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

**ශශිකලා සේනාධීර**
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

මම මගේ විනෝදාංශය විදියට චිත්‍ර අඳින්න ආසයි. පරිසරයේ අලංකාරය, විවිධ මෝස්තර, සතුන් වගේම විවිධ මාතෘකාවලට චිත්‍ර සිතුවම් කරන්න මම කැමතියි.

පැස්ටල් භාවිතය වගේම දිය සායම් භාවිතයෙනුත් මට ලස්සනට සිතුවම් අඳින්නට පුළුවන්.

සිතුවමක් අඳින සෑම වේලාවකදීම මට මගේ සිත සැහැල්លු වෙනවා වගේ දැනෙනවා. ඒ සඳහා යොදන වර්ණ මොනවද කියලා මට මගේ සිතේ මැවෙනවා. එසේ මගේ සිතේ මැවුණු වර්ණ යොදගෙන මම ඉතා අලංකාරව මගේ සිතුවම් වර්ණ ගන්වනවා.





පාසලේ නිවාඩු කාලයක මමත් නංගීත් අම්මාත් මුහුදු වෙරළ නරඹන්න ගියා. අපි එහිදී ඇති තරම් විනෝද වුණා. අයිස්ක්‍රීම් කෑවා. නංගී අයිස්ක්‍රීම් ඉල්ලා අඬන විට මට දුකක් දැනුණා. නැවත ගෙදර පැමිණි පසු මම එම සිදුවීම චිත්‍රයට නැගුවා.



දන්නවද යාළුවනේ..... මම මගේ යාළුවෝ එක්ක වෙල්යායකට ගියා සෙල්ලම් කරන්න. එතනදි මම දැක්කා හරිම ලස්සන අම්මා කෙනෙක්. හැබැයි එයා මනුස්සයෙක් නම් නෙවෙයි. ඒ තමයි අපි සැවොම පෝෂණය කරන කිරි අම්මා. මම එයාව ලස්සනට සිතුවම් කළා.



මේ ඉන්නේ තවත් අම්මා කෙනෙක් එයාගේ ආදරණීය පැටව් එක්ක. මෙයාලා දැක්කම මටත් මගේ අම්මගෙ උණුසුම මතක් වුණා.



මම ඉන්න ආසම කරන තැන තමයි මගේ නිවස. දන්නවද ඇයි කියලා. මගේ පුංචි සුරංගනාවි ඒ කිව්වේ මගේ නංගී ඒ වගේම මගේ අම්මා මගේ අප්පච්චී මගේ අත්තම්මා මගේ අත්තා මේ හැමෝම ඉන්නේ මගේ ගෙදරනෙ. ඒ නිසා මගේ ගෙදර තමයි මම වැඩිපුරම ඉන්න කැමති. බලන්න මගේ පුංචි නිවස ලස්සනයිද කියලා.



සිතුවම් අඳින විට මෝස්තර අඳින්න මට මතක් වෙනවා. මල් මෝස්තර තමයි මම වැඩිපුරම අඳින්න කැමති.මගේ නිර්මාණ පොතට මල් මොස්තර යොදා නිර්මාණය කළ මේ මෝස්තරයත් යොදාගන්න තමයි මගේ අදහස.




පැස්ටල් වලින් වගේම දිය සායම් යොදාගෙනත් මට ලස්සන නිර්මාණ කරන්න පුළුවනි. මේ තමයි මගේ පළවෙනි දිය සායම් නිර්මාණය. දියසායම් වලින් චිත්‍ර සිතුවම් කරන්න මම හරිම ආසයි. ඒ වගේම හරිම පරිස්සමින් මම දිය සායම් සිතුවම් නිර්මාණය කරනවා.



විවිධ අවස්ථා වගේම විවිධ තේමා වලට චිත්‍ර අඳින්න ආස මම මේ සිතුවම් කළේ වෙනස්ම තේමාවකට අයත් අවස්ථාවක්. ඒ තමයි අපේ මුලු ලෝකෙම ප්‍රසිද්ධ ඔලිම්පික් තරඟය. මමත් මගේ මිතුරියන් දෙන්නාත් ඔලිම්පික් තරඟයට ගියොත් මෙහෙම ඉදීවි නේද යාළුවනේ.......



පරිසරය තමයි අපට හුස්ම දෙන්නේ. අපි පරිසරයට වගේම සතා සිවුපාවටත් ආදරය කරන්න ඕනි යාළුවනේ. පරිසරය අලංකාර වෙන්නේ ගස්වැල්, දිය ඇළි, ගංඟා වලින් විතරක් නෙවෙයි කියලයි මම නම් හිතන්නේ. පරිසරය අලංකාරවත් සහ වර්ණවත් වෙන්න සතුනුත් ඕනි. සොබාදහමේ අසිරිය මේ නිර්මාණයෙන් මම සිතුවම් කළේ මෙහෙමයි.



නිවසේදී සෙල්ලම් කිරීමට මට සිටින එකම මිතුරිය තමයි මගේ පුංචි සුරංගනාවී. ඒ කියන්නේ මගේ නංගී. එයා දුකින් ඉන්නවාට මම කැමති නැහැ. දවසක් සෙල්ලම් කරද්දි නංගි එකපාරම ලිස්සලා වැටුණා. නංගී හොඳටම ඇඬුවා. ඒ සිදුවීම මගේ හිතට හුඟක් වේදනාව ගෙනදුන් සිදුවීමක්. ඒ නිසාම මම එය මෙසේ සිතුවම් කළා.



දියසායම් වලින් සිතුවම් කළ මගේ පුංචි දැතින් නිමවුණු සිත්තම් කීපයක් මම ඔබට පෙන්වන්නට කැමතියි. මේ බලන්න යාළුවනේ....... මේ තියෙන්නේ මගේ දියසායම් නිර්මාණ කිහිපයක්. ලස්සනයි නේද......?







මුහුදු වෙරළ ලස්සටම දකින්න පුළුවන් සවස් කාලයට කියලයි මම හිතන්නේ. මුහුදු වෙරළේ අසිරිය දකින්න පුංචි අපි හැමෝම ආසයි. අම්මයි අප්පච්චියි නංගියි එක්ක රැල්ල පාගන්න ගිය දවසක මම මුහුදු වෙරළේ දුටු සැඳෑව මේ අයුරින් කළු චිත්‍ර පොතක සිතුවම් කළේ වෙරළේ මගේ තිබු මතකයන් සිහිපත් කරමින්......



අපේ ගෙදරට හැමදාම එනවා හරි ලස්සන අමුත්තෙක්. එයා ආවම මමයි නංගියි එයාට කෑමයි වතුරයි දෙනවා. එයා අපේ ගෙදර වහලේ පුරාම ඇවිදලා ලස්සන නැටුමක් පෙන්නලා මාවයි නංගිවයි සතුටු කරලා ආපහු යන්න යනවා. අපි හැමදාමත් මේ යාළුවා එනකම් මඟ බලන් ඉන්නවා. බලන්න ඔයාලත් මෙයාව අඳුනනවද කියලා.



වෙල් එළියේ දුවලා පැනලා සෙල්ලම් කරන්න අපි හැමෝම කැමතියි. නංගි පුංචි නිසා නිතර එයා වෙල් යායට එක්කන් යන්න බැහැ. ඒ නිසා හුඟක් වෙලාවට මම තනියෙන් සෙල්ලම් කරන්න යනවා. හැබැයි මගේ තනියට තව පුංචි යාළුවෝ දෙන්නෙකුත් ඉන්නවා. එයාලත් ආසයි මාත් එක්ක සතුටු වෙන්න. ඒ තමයි මගේ සුදු බෝලේයි සුදු චූටියි. බලන්නකෝ දෙන්න මාව බේදාගන්න තරඟ කරන අපූරුව.



සිතුවම් කරන්නට කොතරම් ආසා වුණත් මගේ අනාගත බලාපොරොත්තුව වෛද්‍යවරියක් වීම. මම හරිම කැමතියි රෝගී වූ අයව සුවපත් කරන්න. ඒක ලොකු පිනක් කියලා මගේ අත්තම්මාත් මට කියල තියනවා. මගේ අනාගත බලාපොරොත්තුව මම මෙසේ චිත්‍රයට නැඟුවා යාළුවනේ. ඒත් මම සිතුවම් නිර්මාණය කෙදිනකවත් අතපසු කරන්නේ නැහැ.



දිනපතා ඉගෙනීම් කටයුතු වල නියැලෙන මට සිතුවම් නිර්මාණයට සිත යෙදෙව්මෙන් සිතට සැහැල්ලුවක් වගේම සිතට සතුටක් ලැබෙනවා. සිතුවම් නිර්මාණය මාගේ විනෝදාංශය නිසා මම ඉදිරියටත් මේ වගේ නිර්මාණ බොහෝමයක් කරන්නට ආසාවෙන් ඉන්නවා. සිතුවම් නිර්මාණය කරමින් පුංචි සිත්තරියක් වීම තමයි මගේ පුංචි ආසාව.



# පසු වදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි.

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇතිමෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදූහල්පති තුමිය දියණියන් ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරිමෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇතිබව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණිය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයිතම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

සෙනෙවිරත්න මහලේකම්
ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක